(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක. 240.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2012 දෙසැම්බර් මස 04 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1948/'11

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල මහ රෝහලෙහි ප්‍රමාණවත් තරම් ගොඩනැගිලි, රෝහල් ඇඳන් සහ අනෙකුත් භෞතික සම්පත් නොමැති බවත්;

(ii) එම තත්ත්වය නිසා ප්‍රදේශයේ රෝගී ජනතාව දැඩි පීඩාවට පත්ව සිටින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම රෝහලට අවශ්‍ය සම්පත් ලබාදීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේ වන විටත් වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) අරමුදල් තිබේ නම්, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2321/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලොව බොහෝ රටවල සිදු කරන අයුරින් ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබේද;

(ii) අවම දෝෂ සහිතව විද්‍යුත් ඡන්ද ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීමේදී ඉන්දියාව සතු අත්දැකීම් සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාව තුළ එම ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ සහය ලබාගත හැකිද;

(iii) අවුරුද්දේ එක් මාසයක් තුළ ඡන්ද හිමි ලියාපදිංචිය යාවත්කාලීන කිරීම වෙනුවට විවෘත ඡන්දහිමි ලියාපදිංචි ක්‍රමයක් ස්ථාපනය කළ හැකිද;

(iv) පරිගණක ගත කරන ලද ඡන්ද හිමි නාමලේඛනය දේශපාලන පක්ෂ වෙත ලබාදිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2357/'12

3\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හම්බන්තොට මහ රෝහලේ සෞඛ්‍ය ලිපිකරුවකු ලෙස සේවය කර 2008.12.09 දින විශ්‍රාම ගොස් ඇති මාතර, කෝට්ටගොඩ, පොහොසතුගොඩ, "සෙවන " නිවසෙහි පදිංචි ඒ. කේ. ඒ. පියදාස කොඩිතුවක්කු මහතාට විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් පාරිතෝෂික මුදල හෝ වෙනත් කිසිදු දීමනාවක් මෙතෙක් ගෙවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොඩිතුවක්කු මහතාගේ විශ්‍රාම වැටුප ගෙවීම ප්‍රමාදවීමට හේතුව කවරේද;

(ii) එම විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ කටයුතු පැහැර හරිනු ලබන නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරන්නේද:

(iii) කොඩිතුවක්කු මහතාගේ විශ්‍රාම වැටුප කඩිනමින් ගෙවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2374/'12

4\.
ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ,

(i) නම් කවරේද;

(ii) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) වැටුප්, වේතන සහ දීමනාවල අගයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සමාගමේ සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ වැටුප්, වේතන හෝ දීමනා,

(i) පසුගිය කාලවකවානුවේදී වැඩිකර තිබේද;

(ii) වැඩිකර තිබේ නම්, එය සිදුකර ඇති දිනය කවරේද;

(iii) එසේ වැඩි කිරීමට පෙර පැවති ඒවායේ අගයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2962/'12

5\.
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සමෘද්ධි සහනාධාර ලබන වයස අවුරුදු 70ට වැඩි පුරවැසියන්ට රුපියල් 1,000ක මාසික දීමනාවක් ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකස් කර ඇති බැවින් ඔවුන්ට හිමිවූ සමෘද්ධි සහනාධාර අහෝසි කිරීමට සූදානමක් තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වයස අවුරුදු 70ට වැඩි පුරවැසියන්ට සමෘද්ධි සහනාධාර ලබා දීම සඳහා මාසිකව රජය විසින් වැය කරනු ලැබූ මුළු මුදල කොපමණද;

(ii) ඉහත සඳහන් රු.1000ක දීමනාව ලබාදීම හේතුවෙන් දැනට ලබාදෙන සමෘද්ධි සහනාධාර කපා දැමීමට අනුමතිය ලබා දී තිබේද;

(iii) රුපියල් 1000ක දීමනාව ලබාදීම හේතුවෙන් දැනට ලැබෙන සමෘද්ධි සහනාධාර කපා දැමීම වෙනුවට එම දීමනාව සමග සමෘද්ධි සහනාධාරය ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3035/'12

6.

ගරු රෝසි සේනානායක මහත්මිය,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගම්පහ දුම්රියපළ,

(i) ඉදිකළ දිනය කවරේද;

(ii) ඉදිකළ දින සිට මේ දක්වා ප්‍රතිසංස්කරණය කර ඇති වාර ගණන කොපමණද;

(iii) අවසන්වරට ප්‍රතිසංස්කරණය කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ගම්පහ දුම්රියපළේ,

(i) මහනුවර දෙසට සහ කොළඹ දෙසට ගමන් ගන්නා දෛනික මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දළ දෛනික ආදායම කොපමණද;

(iii) මාසික ආදායම කොපමණද;

(iv) මාසික වාර ප්‍රවේශපත්‍ර ආදායම කොපමණද;

(v) පාර්සල් ආදායම මාසිකව, දළ වශයෙන් කොපමණද;

(vi) තිබෙන ප්‍රවේශපත්‍ර කවුළු ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගම්පහ ඉදිකර ඇති දුම්රිය නිල නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාසයන්හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3102/'12

7.

ගරු පී. හැරිසන් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂය තුළ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි ප්‍රදේශවල නියඟයෙන් වගා හානියට පත්වූ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වගා ඉඩම් හිමියන් අතරින් වන්දි ලබා දුන් සංඛ්‍යාව කොපමණද;

(iii) වන්දි ලෙස ඔවුන්ට ලබාදුන් මුලු මුදල කොපමණද;

(iv) හානි වූ කුඹුරු ඉඩම් වෙනුවෙන් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් බිත්තර වී ලබා දුන් කුඹුරු ඉඩම් ප්‍රමාණය සහ ලබා දුන් බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(v) වගා හානි වෙනුවෙන් ට්‍රැක්ටර් කුලී සහනය ලෙස අක්කරයක් වෙනුවෙන් ලබාදුන් මුදල කොපමණද;

(vi) ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහවැලි එච් කලාපයේ ඇති ගොවි සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගොවි සංවිධාන අතරින් මේ වන විට රුපියල් ලක්ෂය බැගින් ලබා දී ඇති ගොවි සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ මුදල් නොලැබූ ගොවි සංවිධානවලට ඉදිරියේදී එම මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහවැලි ප්‍රදේශවල ළිං පිළිසකර කිරීම සඳහා 2012 වර්ෂය තුළදී දුන් මුළු මුදල කොපමණද;

(ii) එක් ළිඳක් වෙනුවෙන් වෙන් කළ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3139/’12

8.

ගරු අබ්දුල් හලීම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හාරිස්පත්තුව සංවර්ධන පදනම නමැති ආයතනය මගින් 1994 වර්ෂයේදී හල්ලොලුව, වරාතැන්න මහවැලි ගඟ මැද පිහිටි ඓතිහාසික ස්ථානයක ඉදිකර, සංඝ රත්නයට පූජාකළ උදකුක්ඛේප සීමාමාලකය උඩරට අමරපුර සංඝ නිකායේ උපසම්පදා විනය කර්ම සිදු කරන ස්ථානය බවත්;

(ii) මේ වන විට එකී පූජනීය ස්ථානය ඉවත් කර එම ස්ථානයේ පෞද්ගලික විදුලි බලාගාරයක් ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුවන බවත්;

(iii) ඓතිහාසික වැදගත්කමක් ඇති එම පූජනීය ස්ථානය විනාශ කිරීම සම්බන්ධයෙන් දැඩි කලකිරීමට පත්ව ඇති අමරපුර නිකායට අදාළ දිවයින පුරා සිටින ගිහි, පැවිදි බොහෝ පිරිසක් ඊට එරෙහිව විරෝධතාවයකට සූදානම් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උඩරට අමරපුර නිකායේ පරිහානියට තුඩු දෙන එම පෞද්ගලික විදුලි බලාගාරය ඉදි කිරීමේ කටයුතු වහාම නතර කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඓතිහාසික හා පාරම්පරික වටිනාකමක් ඇති උදකුක්ඛේප සීමාමාලකය තුළ ඉදිරියටත් බාධාවකින් තොරව එකී නිකායේ විනය කර්ම සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2013) — (දහනවවැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 03 වැනි දින ප්‍රගතිය)

*2.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ නියෝග,—ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතේ 15 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 22 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 නොවැම්බර් 08 දිනැති අංක 1783/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*3.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ නියෝග,— (437 වැනි අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 සැප්තැම්බර් 20 දිනැති අංක 1776/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.11.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*4.

දිවි නැගුම පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2012 නොවැම්බර් මස 06) [1]

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය,— 2011.08.15 දින සිට පත් කරනු ලැබූ වත්මන් විගණකාධිපතිවරයා වන එච්. ඒ. එස්. සමරවීර මහතාගේ වැටුප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(2) ව්‍යවස්ථාව අනුව පහත සඳහන් පරිදි විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

විගණකාධිපති එච්. ඒ. එස්. සමරවීර මහතා එම තනතුරට පත්කළ 2011.08.15 වැනි දින සිට SL- 4 - 2006 වැටුප් පරිමාණයේ 2 වැනි පියවර වන රු.48,940.00 පියවරේ පිහිටුවා වැටුප් ගෙවීම, තනතුරට හිමි අනෙකුත් දීමනා ගෙවීම සහ වැටුප් පරිමාණයේ සඳහන් පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම කළයුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති

කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*12.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වැනි) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

13.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

පා.167/'12

16.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු මහින්ද අමරවීර මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු සනත් ජයසූරිය මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු ජගත් බාලසූරිය මහතා

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු දයාශ්‍රිත තිසේරා මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු ඒ. එල්. එම්. අතාවුල්ලා මහතා

ගරු එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා
ගරු නිර්මල කොතලාවල මහතා
ගරු විජිත බේරුගොඩ මහතා
ගරු ජානක වක්කුඹුර මහතා
ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා
ගරු ලලිත් දිසානායක මහතා
ගරු විජය දහනායක මහතා
ගරු සරණ ගුණවර්ධන මහතා
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
ගරු අචල ජාගොඩගේ මහතා
ගරු සාලින්ද දිසානායක මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු කමලා රණතුංග මෙනෙවිය
ගරු ජයරත්න හේරත් මහතා
ගරු රෝහණ දිසානායක මහතා
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා
ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා
ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
ගරු වික්ටර් ඇන්ටනි මහතා
ගරු සරත් කුමාර ගුණරත්න මහතා
ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා
ගරු මනූෂ නානායක්කාර මහතා
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු මිලේරෝයි ප්‍රනාන්දු මහතා
ගරු ලොහාන් රත්වත්තේ මහතා
ගරු හුනෙයිස් ෆාරුක් මහතා
ගරු උපේක්ෂා ස්වර්ණමාලි මහත්මිය
ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු පියංකර ජයරත්න මහතා
ගරු හේමාල් ගුණසේකර මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු ජානක බණ්ඩාර මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු රුවන් රණතුංග මහතා
ගරු ෆීලික්ස් පෙරේරා මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා
ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා
ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා
ගරු සී. බී. රත්නායක මහතා
ගරු දුමින්ද දිසානායක මහතා
ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
ගරු ගාමිණී විජිත් විජිතමුණි ද සොයිසා මහතා
ගරු පී. දයාරත්න මහතා
ගරු තිලංග සුමතිපාල මහතා
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු අර්ල් ගුණසේකර මහතා
ගරු සී. ඒ. සූරියආරච්චි මහතා
ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා
ගරු වී. කේ. ඉන්දික මහතා
ගරු ටී. බී. ඒකනායක මහතා
ගරු පී. පියසේන මහතා
ගරු ගුණරත්න වීරකෝන් මහතා
ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා
ගරු සිරිපාල ගමලත් මහතා
ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
ගරු තිස්ස කරල්ලියද්ද මහතා
ගරු ප්‍රභා ගනේසන් මහතා
ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු ජීවන් කුමාරණතුංග මහතා
ගරු රංජිත් සියඹලාපිටිය මහතා
ගරු එස්. බී. නාවින්න මහතා
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා
ගරු ශෙහාන් සේමසිංහ මහතා
ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා
ගරු දිළුම් අමුණුගම මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු ඩබ්ලිව්. බී. ඒකනායක මහතා

ගරු රොෂාන් රණසිංහ මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු පෙරුමාල් රාජදුරයි මහතා

ගරු සිල්වේස්ත්‍රි අලාන්ටින් මහතා

ගරු නිරූපමා රාජපක්ෂ මහත්මිය

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු නවීන් දිසානායක මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු බෂීර් සේගු ඩාවුඩ් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාර ධුරයෙන් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංගුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත් කිරීම සඳහා අතිගරු ජනාධිපතිවරයා වෙත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(2) ව්‍යවස්ථාව ප්‍රකාර යෝජනාව,—

1. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් සමාගම් වන සෙලින්කෝ ශ්‍රී රාම් කැපිටල් මැනේජ්මන්ට්, ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පැනි සහ ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි කම්පැනි ලිමිටඩ් යන සමාගම්වලට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති මූලික අයිතිවාසිකම් අයදුම්පත් අංක පිළිවෙළින් 262/2009, 191/2009 සහ 317/2009 දරන නඩු ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙනත් විනිසුරු මඬුල්ලක් විසින් විභාග කරමින් තිබියදී, එකී නඩු එම විනිසුරු මඬුල්ලෙන් ඉවත්කර, තම අධිකරණයේ වැඩිදුර විභාගය සඳහා ගෙන එම නඩු විභාග කිරීමේ විනිසුරු මඬුල්ලේ සභාපති විනිසුරු ලෙස කටයුතු කරමින් එම නඩුවල විෂයය වස්තුවක් වන්නා වූ සෙලින්කෝ නිවාස සහ දේපල සමාගම නමින් හැඳින් වූ, සිටි හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් සහ සෙලින්කෝ කොන්ඩොමීනියම් ලිමිටඩ් නමින් හැඳින්වූ වර්තමානයේ ට්‍රිලියම් රෙසිඩන්සීස් නමින් හඳුන්වනු ලබන ආයතනයට අයත්, කොළඹ 08, ඇල්විටිගල මාවතේ, අංක 153 දරන ස්ථානයේ පිහිටි, ශ්‍රේෂ්ඨාධිකරණ මූලික අයිතිවාසිකම් අයදුම්පත් අංක 262/2009 දරන නඩුවේ දේපල ලැයිස්තුවේ සඳහන් නිවාස ව්‍යාපෘතියෙන් අංක 2සී/එෆ්2/පී4 සහ වරිපනම් අංක 153/1-2/4 දරන නිවස, ඔස්ට්‍රේලියාවේ, බටහිර ඔස්ට්‍රේලියා 6016හි, මවුන්ට් හෝතෝර්න් හි, එජීනා වීදියේ, අංක 127 දරන ස්ථානයේ පදිංචි රේණුකා නිරංජලී බණ්ඩාරනායක සහ කපිල රන්ජන් කරුණාරත්න යන දෙදෙනා විසින් ලබාදෙන ලද ප්‍රසිද්ධ නොතාරිස් කේ. බී. අරෝෂි පෙරේරාගේ අංක 823 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය උපයෝගී කරගෙන රේණුකා නිරංජලී බණ්ඩාරනායක සහ කපිල රන්ජන් කරුණාරත්න යන දෙදෙනාගේ නමට මිල දී ගැනීමෙන් ද;

2. ඉහත කී දේපළ මිල දී ගැනීම සඳහා ගෙවීම් කිරීමේ දී උපයා ගත් ආකාරය හෙළි කළ නොහැකි රුපියල් 19,362,500ක මුදලක් එම දේපළ මිල දී ගැනීමට පෙර එම දේපළ

විකුණන ලද සිටි හවුසින් ඇන්ඩ් රියල් එස්ටේට් කම්පැනි ලිමිටඩ් සහ ට්‍රිලියම් රෙසිඩන්සීස් සමාගමට මුදලින් ගෙවීමෙන් ද;

එන්ඩීබී බැංකුවේ, කොළඹ 07, ධර්මපාල මාවතේ පිහිටි ශාඛාවේ 106450013024, 101000046737, 100002001360 සහ 100001014772 යන ගිණුම්වලට 2011 අප්‍රේල් 18 සිට 2012 මාර්තු 27 දින දක්වා කාලය තුළ රුපියල් මිලියන 34ක පමණ විදේශීය මුදල් තැන්පත් කිරීමෙන් පසු එම තොරතුරු අධිකරණ නිලධාරියෙකු විසින් ලබා දිය යුතු වාර්ෂික වත්කම් සහ බැරකම් ප්‍රකාශයේ සඳහන් නොකිරීමෙන් ද;

4. ඉහත කී එන්ඩීබී බැංකු ශාඛාවේ ගිණුම් අංක 106450013024, 101000046737, 100002001360, 100001014772, 100002001967, 100101001275, 100110000338, 100121001797 සහ 100124000238 දරන ගිණුම් නවයක් ඇතුළුව විවිධ බැංකුවල බැංකු ගිණුම් විස්සකට අධික සංඛ්‍යාවක් පවත්වාගෙන යමින්, එකී තොරතුරු අධිකරණ නිලධාරියෙකු විසින් ලබාදිය යුතු වාර්ෂික වත්කම් සහ බැරකම් ප්‍රකාශයේ සඳහන් නොකිරීමෙන් ද;

5. දැනට කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පවතින වර්ෂ 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභා පනත යටතේ අල්ලස් සහ/හෝ දූෂණ ක්‍රියාවලට අදාළ වරදවල් සම්බන්ධයෙන් නීති කෘත්‍යයන්වලට එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මියගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා වන ප්‍රදීප් ගාමිණී සුරාජ් කාරියවසම් මහතා සැකකරුවෙකු වන හෙයින් ද;

ඉහත කී අල්ලස් හෝ දූෂණ නඩුව විභාගවීමට නියමිත වූ එකී අධිකරණයේ මහේස්ත්‍රාත්වරයා මාරු කිරීම, විනය පාලනය සහ ඉවත් කිරීමේ බලතල පැවරී ඇති අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ධුරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ(2) ව්‍යවස්ථාව අනුව එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් දරන හෙයින් ද;

එකී අධිකරණය විසින් පවත්වාගෙන යනු ලබන අධිකරණ වාර්තා, රෙජිස්ටර් සහ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමේ බලතල අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරිය වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ(3) ව්‍යවස්ථාව යටතේ එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය වෙත පැවරී ඇති හෙයින් ද;

ඉහත කී ආකාරයට ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මියගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා වන ප්‍රදීප් ගාමිණී සුරාජ් කාරියවසම් මහතාට එරෙහිව ඉදිරිපත් කර ඇති අල්ලස් හෝ දූෂණ චෝදනාවලට අදාළ නීති කෘත්‍යය හේතුවෙන් අග්‍ර විනිශ්චයකාර ධුරයේ තව දුරටත් ක්‍රියා කිරීමට එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය නුසුදුස්සෙකු වන හෙයින් ද, අග්‍ර විනිශ්චයකාර ධුරයේ ඇය අඛණ්ඩව ක්‍රියා කිරීම හේතුවෙන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ඉෂ්ට කිරීම සඳහා බාධාවක් වීම සහ යුක්තිය පසිඳලීම පිළිබඳ මූලික සිද්ධාන්ත එමගින් උල්ලංඝනය වන බැවින් සහ යුක්තිය ඉටුවීම පමණක් නොව යුක්තිය ඉටුවන බවට දෘශ්‍යමාන විය යුතු හෙයින්ද;

6. මුල් අවස්ථා අධිකරණවල ජ්‍යෙෂ්ඨ නිලධරයන් අතුරෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා පත්කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ ව්‍යවස්ථාව

මගින් ප්‍රතිපාදන සලසා තිබියදී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය අග්‍ර විනිශ්චයකාරවරිය වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ලෙස ඇගේ නිල තත්ත්වයෙන් ක්‍රියා කරමින්, මුල් අවස්ථා අධිකරණයන්හි සුදුසු ජ්‍යෙෂ්ඨ අධිකරණ නිලධාරීන් සිටියදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් එසේ නොවන නිලධාරියෙකු වන මංජුල තිලකරත්න මහතා පත් කිරීමෙන් අධිකරණ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය නොසලකා හැරීමෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරිය වශයෙන් කටයුතු කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති හෙයින් ද;

7. අංක 2/2012 සහ 3/2012 දරන ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීන්දු සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව යටතේ වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය යටතේ පවරන ලද පෙත්සමක පිටපතක් ඒ අවස්ථාවේදීම පාර්ලිමේන්තුවේ කථානායකවරයාට භාරදිය යුතු බවට සඳහන්ව තිබියදී, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට අධිකරණයේ ගොනු කරනු ලැබූ පෙත්සමක පිටපතක් භාරදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති ප්‍රතිපාදන සපුරා ඇති බවට එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ තීන්දුවක් ප්‍රකාශයට පත්කිරීමෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව නොසලකා හැර සහ / හෝ පටහැනිව ක්‍රියාකර ඇති හෙයින් ද;

8. අංක 5/91, 6/91, 7/91 සහ 13/91 දරන ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීන්දු වලදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අර්ථ නිරූපණය කර ඇති ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාවේ සඳහන් අනිවාර්ය ක්‍රියාපටිපාටියට අනුකූලව ක්‍රියාකළ යුතු බවට තීරණය කර තිබුණ ද, ඉහත කී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් එකී ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති හෙයින් ද;

9. ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරියක වශයෙන් පත්කරන අවස්ථාවේදී ඇයගේ පත්වීම අභියෝගයට ලක්කරමින් පවරන ලද ජනාධිපති නීතිඥ එඩ්වඩ් ප්‍රැන්සිස් විලියම් සිල්වා සහ තවත් තිදෙනෙක් එදිරිව ශිරානි බණ්ඩාරනායක (1992 ශ්‍රී ලංකා නව නීති වාර්තා 92) මූලික අයිතිවාසිකම් කඩ කිරීමේ නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද බහුතර තීරණය නොසලකා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ධූරයට පත්වීමෙන් පසු එකී තීන්දුවට පටහැනිව කටයුතු කර ඇති හෙයින් ද;

10. ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරියක වීමට ප්‍රථම කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ කථිකාචාර්යවරියකව සිටියදී, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මියගේ ලිපියක් ප්‍රකාශයට පත්කර තිබූ Groundview නමැති මාධ්‍ය ප්‍රකාශන අංශය අයත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නමැති ආයතනය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ තීන්දු පෙත්සම් අංක 02/2012 දරන පෙත්සම අසා තීරණයක් ලබා දී ඇති හෙයින් ද;

11. අග්‍ර විනිශ්චයකාර ධූරය දරනු ලබන සහ එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිධූරය දරනු ලබන ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරධූරයකට

පත්කිරීමේ යෝග්‍යතාව අභියෝගයට ලක්කරන ලද ජනාධිපති නීතිඥ එඩ්වඩ් ප්‍රැන්සිස් විලියම් සිල්වා සහ තවත් තිදෙනෙක් එදිරිව ශිරානි බණ්ඩාරනායක (1992 ශ්‍රී ලංකා නව නීති වාර්තා 92) නඩුවේදී එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මියගේ පත්වීමට එරෙහිව කුරුප්පුගේ බීටා ඈන් වර්ණසූරිය ස්වර්ණාධිපති මහෙස්ත්‍රාත්වරියගේ සහෝදරයා වූ නීතිඥ එල්. සී. එම්. ස්වර්ණාධිපති යන අය පෙත්සමක් ඉදිරිපත් කිරීම හේතුවෙන්, එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් එකී මහේස්ත්‍රාත් කුරුප්පුගේ බීටා ඈන් වර්ණසූරිය ස්වර්ණාධිපතිට හිරිහැර සිදුකර ඇති හෙයින්ද;

12. අග්‍ර විනිශ්චයකාරධුරය දරනු ලබන සහ එමගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිධුරය දරනු ලබන ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ ව්‍යවස්ථාව ප්‍රකාරව පැවරී ඇති ඇගේ ව්‍යවස්ථානුකූල බලය අභිබවා ක්‍රියාකරමින්, මහෙස්ත්‍රාත් රංගනී ගමගේ මහත්මියට තමාගේ නීත්‍යානුකූල අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට පෙරාතුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවසරය ලබාගන්නා ලෙස නියම කිරීම මගින්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මංජුල තිලකරත්න මහතා විසින් ඇයට සිදු කළ හිංසනය සම්බන්ධයෙන් පොලීසියට පැමිණිල්ලක් කිරීම සඳහා රංගනී ගමගේ මහෙස්ත්‍රාත්වරියගේ නීතියේ පිහිට ලබාගැනීමේ අයිතියට බාධා එල්ලකර ඇති හෙයින් ද;

13. එකී ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් අග්‍ර විනිශ්චයකාරවරිය වශයෙන් සහ ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඇ(2) ව්‍යවස්ථාව ප්‍රකාරව අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ක්‍රියාකරමින්, තම බලය අනිසි ලෙස භාවිතා කරමින් මහෙස්ත්‍රාත් රංගනී ගමගේ මහත්මියට පොලිස් ආරක්ෂාව ලබා ගැනීමට පෙරාතුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවසරය ලබාගන්නා ලෙස නියම කරමින් ඇයට පොලිස් ආරක්ෂාව ලබා ගැනීමට ඇති නීත්‍යානුකූල අයිතිය ක්‍රියාත්මක කිරීම වළක්වා ඇති හෙයින් ද;

14. තම නීත්‍යානුකූල අයිතිය ක්‍රියාත්මක කරමින් මහේස්ත්‍රාත් රංගනී ගමගේ මහත්මිය විසින් පොලිස්පතිවරයාගෙන් ආරක්ෂාව ඉල්ලා සිටීම පිළිබඳව විනය පරීක්ෂණයක් නොපැවැත්විය යුත්තේ ඇයිද යන්න පිළිබඳ එකී මහෙස්ත්‍රාත් රංගනී ගමගේ මහත්මියගෙන් නිදහසට කරුණු විමසමින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති ලෙස ක්‍රියා කරමින් ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය විසින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ලිපියක් යොමුකර ඇති හෙයින් ද;

ඉහත කී ආකාරයෙන් කටයුතු කිරීම මගින්,—

(i) අනිසි පැවැත්මක් හෝ අග්‍ර විනිශ්චයකාරධුරය දරන්නෙකුට නොගැලපෙන අන්දමේ පැවැත්මක් හෝ ස්ථාපිත වන බැවින්ද,

(ii) අධිකරණවල නඩු කාරණා විය හැකි කරුණු සම්බන්ධයෙන් ප්‍රශ්න හෝ මතභේදයට ඉවහල් වන කරුණු සම්බන්ධයෙන් අදාළ වන සහ / හෝ විය හැකි කරුණු සම්බන්ධයෙන් කටයුතු කර ඇති බැවින්ද,

(iii) සාධාරණ යුක්තිය සලසාලීම කෙරෙහි බලපෑම් ඇති කර ඇති හෙයින්ද,

(iv) නඩු පාර්ශ්වයන් විසින් පක්ෂපාතීත්වය සහ / හෝ අපක්ෂපාතීත්වය පිළිබඳ

චෝදනා එල්ල කිරීමට ඉඩ ඇති හේතු ඇතිවිය හැකි බැවින්ද,

මුළු මහත් ශ්‍රේෂ්ඨාධිකරණය සහ විශේෂයෙන්ම අග්‍ර විනිශ්වයකාර ධූරය අපකීර්තියට පත් කර ඇත්තේය.

එබැවින්, ඉහත සඳහන් විෂමාචාර චෝදනා හේතුවෙන්, එම විෂමාචාර චෝදනා පිළිබඳව පරීක්ෂාකර එම චෝදනා එකක් හෝ එයට වැඩි ගණනක් ඔප්පුවී ඇතැයි විශේෂ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබුවහොත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍ර විනිශ්වයකාර පදවියෙන්, ගරු (ආචාර්ය) උපතිස්ස අතපත්තු බණ්ඩාරනායක වාසල මුදියන්සේ රාළහාමිලාගේ ශිරානි අංශුමාලා බණ්ඩාරනායක මහත්මිය ඉවත්කිරීම සඳහා යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කළ හැකි වන පරිදි පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107(3) ව්‍යවස්ථාව සමග කියැවෙන 107(2) ව්‍යවස්ථාවේ විධිවිධාන සහ, 78 අ දරන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ද ප්‍රකාරව යෝජනා කර සිටිමු.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2013) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.